# පුහුණු සාගර විද්‍යාඥයකු වන්නට....





අධ්‍යක්ෂ නාවික මෙහෙයුම්
ඩැරල් ජේ. සිල්වා



අධ්‍යක්ෂ
ගාමිණී ලොකුකැටගොඩ



විදුහල්පති කථිකාචාර්ය
නාලක ජයකොඩි

**රැකියා විරහිතභාවය අද රටේ දැවෙන ප්‍රශ්නයකි. ඒ පිරිස අතර උපාධිධාරීහු ද සිටිති. එයට හේතු වශයෙන් බොහෝ කරුණු සඳහන් කළ හැකිය. අධ්‍යාපනය වෙනුවෙන් ජීවිතයේ තරුණ විය කැප කරන සිසුන් විශ්ව විද්‍යාලයෙන් පිටවන්නේ සැපවත් පුද්ගලික ජීවිතය පිළිබඳ සිහිනයටත් වඩා පවුලේ ආර්ථිකයට සහනයක් වනු අපේක්ෂාව ඇතිවය.**

විශ්ව විද්‍යාලය තුළ වසර 3 - 4 කාලයක් ගත කර ඉන් පිට වූ පසුත් වසර ගණනාවක් රැකියා විරහිතභාවයෙන් පෙළීමෙන් හානි සිදුවන්නේ ඔවුනට පමණක් නොවේ. රටට ද එය බලපායි.

මන්ද රජයක් එක් සිසුවකු වෙනුවෙන් විශාල මුදලක් වැය කරන බැවිනි. ඒ හැරත් එම උගතුන්ගේ දායකත්වයක් රටේ සංවර්ධනයට එක් නොවන බැවිනි.

කෙසේ වෙතත් විශ්ව විද්‍යාල තුළ අවුරුදු ගණන් ගත කරනවාට වඩා අ. පො. ස. (සා. පෙළ) සමත් වූ විගසම තමන් කැමැති ක්ෂේත්‍රයකින් උසස් අධ්‍යාපනයක් හා පුහුණුවක් ලබා සාඩම්බර රැකියාවක නිරතවීමට හැකි විශ්ව විද්‍යාලයක් ශ්‍රී ලංකාවේ පරිපාලන අගනුවර වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරයට ආසන්නව මාලඹේ නගරයේ පිහිටුවා ඇත.



මේ පිළිබඳ කරුණු දැන ගැනීමට එහි අධ්‍යක්ෂ නාවික මෙහෙයුම් ඩැරල් ජේ. සිල්වා මහතාත්, අධ්‍යක්ෂ ගාමිණී ලොකු-කැටගොඩ මහතාත්, විදුහල්පති කථිකාචාර්ය නාලක ජයකොඩි මහතාත් හමු වී කළ සාකච්ඡාවකින් මේ ලිපිය සකස් කර ඇත.

කොළඹ ජාත්‍යන්තර නාවික හා ඉංජිනේරු විද්‍යාලය(CINEC) වෙළෙඳ නාවික අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කර ඇති ශ්‍රී ලංකාවේ විශාලතම සාගර අධ්‍යාපන හා පුහුණු පහසුකම් ඇති ආයතනයකි.CINEC විද්‍යාලය ස්ථාපිත කරන ලද්දේ මුහුදු යන්නන්ට වෘත්තීමය අධ්‍යාපනයක් ලබාදීම අරමුණු කර ගෙනය.

මෙම විද්‍යාලයේ මූලික අරමුණ මුහුදු යන්නන්ගේ හැකියාවන් IMO/STCW 95 ප්‍රඥප්තියට ගැලපෙන ලෙස වර්ධනය කිරීමය.


එමෙන්ම ඔවුන්ගේ එම වෘත්තීමය ප්‍රමිතිය නැව් හිමියන් ඉල්ලා සිටින පරිදි දිගටම පවත්වා ගැනීමය.


CINEC සාගර විද්‍යාලය ආසියාවේ පවතින හොඳම සාගර අධ්‍යාපන හා පුහුණු ආයතන වලින් එකකි. මෙම විද්‍යාලය ශ්‍රී ලංකාවේ පළමු අධ්‍යාපනික සංවිධානයෙන් හා ISO 9001 තත්ත්ව සහතිකයට ළඟා වූ දකුණු ආසියාවේ පළමු සාගර මුහුදු පහසුකම් සහිත එකක් වීමේ ගෞරවයත් හිමිවේ. වර්තමානයේ මෙම විද්‍යාලයටISO 9001 හා 2000 තත්ත්ව සහතිකයත් එක්සත් රාජධානිය මගින් ප්‍රදානය කළා.

මෙම ආයතනය "අනර්ඝත්වය සඳහා වූ ජාතික තත්ත්ව සහතිකය" ලබාගත් පළමු හා එකම ආයතනය වේ. මෙම විද්‍යාලය ISO 14001 පරිසර ප්‍රමිතියට ද අනුකූල වේ. එසේම මෙම පාඨමාලාවන්ට බඳවා ගන්නේ අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වූ අය ය.

අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි සිසුවකු නැවත අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිට ප්‍රතිඵල එන විට අවුරුදු 3 ක කාලයක් පමණ ගත වේ. ඉන්පසු අ. පො. ස. (උ. පෙළ) ප්‍රතිඵල වලින් මෙම ආයතනයට පැමිණීමට බලාපොරොත්තු වන්නේ නම් අවුරුදු 3 ක කාලයක් නිකරුණේ ගත වේ.

මෙම ආයතනය "අනර්ඝත්වය සඳහා වූ ජාතික තත්ත්ව සහතිකය" ලබාගත් පළමු හා එකම ආයතනය වේ. මෙම විද්‍යාලය ISO 14001 පරිසර ප්‍රමිතියට ද අනුකූල වේ. එසේම මෙම පාඨමාලාවන්ට බඳවා ගන්නේ අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වූ අය ය. අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිටි සිසුවකු නැවත අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිට ප්‍රතිඵල එන විට අවුරුදු 3 ක කාලයක් පමණ ගත වේ. ඉන්පසු අ. පො. ස. (උ. පෙළ) ප්‍රතිඵල වලින් මෙම ආයතනයට පැමිණීමට බලාපොරොත්තු වන්නේ නම් අවුරුදු 3 ක කාලයක් නිකරුණේ ගත වේ.







එහෙත් අ. පො. ස. (සා. පෙළ) විභාගයට පෙනී සිට මෙම ආයතනයට පැමිණීමට බලාපොරොත්තු වන්නේ නම් මාස 6 ක මූලික පුහුණු පාඨමාලාවකින් පසුව අ. පො. ස. (උ. පෙළ) ප්‍රතිඵලවලට සමාන සුදුසුකම් සහිතව මෙම ආයතනයට පැමිණිය හැකිය. එවිට කාලය විශාල වශයෙන් ඉතිරිවේ. එමෙන්ම සිසුවකුට මෙම විද්‍යාලයට ඇතුළු-වීමේ දී අවශ්‍ය දේ මෙසේ සඳහන් කළ හැකිය.

* අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේදී අයදුම්කරුට වයස අවුරුදු 18 ට නොඅඩු හෝ 21 ට නොවැඩි විය යුතුයි.

* අ. පො. ස. (සා. පෙළ) විභාගය ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයන්ට සම්මාන සහිතව සමත් විය යුතුයි.

* අ. පො. ස. (උ. පෙළ) විභාගය භෞතික විද්‍යාව ද ඇතුළුව විද්‍යා අංශයෙන් විෂයයන් තුනකින් සමත්වීම හෝ පරිපාලනය විසින් පිළිගන්නා සමාන අධ්‍යාපන සුදුසුකම් සහිත විය යුතුයි. (අධ්‍යක්ෂ වෙළෙඳ නාවුක)

* විද්‍යාලය මගින් පවත්නා යෝග්‍යතා පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් අයදුම්කරු සමත්විය යුතුයි.

* අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකින් හා දෘෂ්ඨි පරීක්ෂණයකින් විද්‍යාලය සෑහීමට පත්වන පරිදි සමත් විය යුතුයි. (6/18 පෙනී-මක් ඇස් දෙකටම හා වර්ණ පරීක්ෂණ-යකට)

සාගර විද්‍යාලයේ නවීන පන්ති කාමර පහසුකම්, විද්‍යාගාර, වැඩමුළු සඳහා කාමර ආදියෙන් සමන්විත වේ. ජීව ආකෘතිම ය පුහුණු මධ්‍යස්ථානයත් නවීන තාක්ෂණික උපකරණවලින් ද සමන්විත වේ. මෙම නවීන උපකරණ පරිහරණය හේතුවෙන් සිසුනට පාඨමාලාවන් හැදෑරීම වඩාත් පහසු වේ. අප විද්‍යාලයේ පාඨමාලාවන් රාශියක්


> සාගර අධ්‍යාපන පුහුණුවේදී ජීව ආකෘතිමය උපකරණ භාවිත කිරීම, නාවික නිලධාරීන්ගේ හැකියාව වර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය බව දීර්ඝ කාලීනව හඳුනාගෙන තිබෙනවා. මෙම වාතාවරණය තුළ CINEC සාගර විද්‍යාලය එහි නවීන ජීව ආකෘතිමය පුහුණු මධ්‍යස්ථානය නැවේ උඩ කොටසේ හා සාගර ඉංජිනේරු කාමර සහිත වූ නවීන තාක්ෂණික පහසුකම් සහිතව සකස් කොට තිබෙනවා. නැවේ උඩ තට්ටුවේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ (කපිතාන්ගේ කටයුතු) අංග සම්පූර්ණ ජීව ආකෘතිමය පුහුණු මධ්‍යස්ථානය, නවීන තාක්ෂණයෙන් හා ජීව ආකෘතිමය පුහුණු උපදෙස් දෙන ආයතනයකින් ද සමන්විත වේ.

ක්‍රියාත්මක වේ. එයින් ප්‍රධාන වන්නේ ජීව ආකෘතිමය පුහුණුව හා සාගර ඉංජිනේරු පාඨමාලාවයි. වෙල්ඩින් පාඨමාලාව, ඩීසල් ඉංජිනේරු පාඨමාලාව හා යාන්ත්‍රික ඉංජි-නේරු පාඨමාලාව අප ආයතනය මගින් පවත්වාගෙන යන අනෙක් පාඨමාලාවනවා.

**ජීව ආකෘතිමය පුහුණුව**

සාගර අධ්‍යාපන පුහුණුවේදී ජීව ආකෘති-මය උපකරණ භාවිත කිරීම, නාවික නිලධා-රීන්ගේ හැකියාව වර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය බව දීර්ඝ කාලීනව හඳුනාගෙන තිබෙනවා. මෙම වාතාවරණය තුළ CINEC සාගර ෂද්‍යාලය එහි නවීන ජීව ආකෘතිමය පුහුණු මධ්‍යස්ථානය නැවේ උඩ කොටසේ හා සාගර ඉංජිනේරු කාමර සහිත වූ නවීන තාක්ෂණික පහසුකම් සහිතව සකස් කොට තිබෙනවා. නැවේ උඩ තට්ටුවේ කටයුතු ක්‍රියාත්මක කිරීමේ (කපිතාන්ගේ කටයුතු) අංග සම්පූර්ණ ජීව ආකෘතිමය පුහුණු මධ්‍යස්ථානය, නවීන තාක්ෂණයෙන් හා ජීව ආකෘතිමය පුහුණු උපදෙස් දෙන ආයතනයකින් ද සමන්විත වේ.

මෙම උපකරණ ප්‍රඥප්තිය මගින් ප්‍රකාශිත රෙගුලාසිවලට එකඟවෙනවා. එය බහුලව භාවිත කරන්නේ ජ්‍යෙෂ්ඨ නාවික නිලධාරීන්ගේ නාවික කටයුතු පුහුණු කිරීමේ දී හා කනිෂ්ඨ නාවික නිලධාරීන්ගේ ආරක්ෂක සේවා මුර කාර්යන්ගේ හැකියා-වන් වර්ධනය කිරීම සඳහායි. එය වරාය නියමුවන් හා නැව් අදින යාත්‍රා (TAG) ක්‍රියාකරුවන් පුහුණු කිරීම සඳහා ද භාවිත වේ. මෙම ජීව ආකෘතිමය පුහුණු මධ්‍යස්ථා-නය විශේෂිත පුහුණු පර්යේෂණ හා වරාය සංවර්ධන කටයුතුවලට ද භාවිත කළ හැකි අතර කාර්ය සාදනය ඇගයීම සඳහා නැව් පිළිබඳ අත්හද බැලීම් ක්‍රියාවලිය සඳහා ද භාවිත කළ හැකියි.



### එන්ජින් කාමර ජීව ආකෘතිමය පුහුණුව

මෙහිදී එන්ජින් පාලක කුටිය සමග සම්බන්ධ වේ. මෙම පුහුණුව සඳහා ඇති විද්‍යුත් ක්‍රම හා සහායක යන්ත්‍රෝපකරණ ද මගින් අධ්‍යාපනය හා පුහුණුව ලබා දේ. එවන් පුහුණුවක් මගින් ආධුනිකයන් හට මනා ප්‍රතිඵල ලබාගත හැකිවේ. මෙහි දී පුහුණුවන සාගර ඉංජිනේරුවන්ට එන්ජින් කුටියේ ඇති යන්ත්‍ර හා නැව් සඳහා වන එන්ජින් පාලක කුටි ඉහළ මට්ටමේ ස්වයංක්‍රීයත්වයකින් ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණුවක් ලබා දේ. මෙම පුහුණුවට අමතරව මෙම මධ්‍යස්ථානයේ ඉහළ නිලධාරීන්ගේ එන්ජිම සම්බන්ධ විවිධ ගැටලු හා නැව ගමන් කිරීමේ උපකාරක මැෂින් පද්ධතිය, සහායක උපකරණ පද්ධතිය හා නැවේ විදුලි බල ජනක ඒකක ක්ෂේත්‍රවල පුහුණුව සිදු කරනවා.

මෙම පුහුණුව ද IMO/STLW 95 සංශෝධිත ප්‍රඥප්තියේ සියලුම අවශ්‍යතා නියෝජනය කැරේ. එසේම නැව් සමාගම්වල අවශ්‍යතා සඳහා විශේෂ වන පුහුණු හා අධ්‍යාපන වැඩ සටහන් දියුණු කිරීමට ද ක්‍රියා කැරේ.

මෙම පුහුණුවන්නන් සඳහා යම් කාල සීමාවක් අවශ්‍යවේ. ඒ සඳහා මෙම වැඩ සටහන අදියර තුනකින් සමන්විත වේ. පළමු අදියර විද්‍යාලය පදනම් කොට ගත් මාස 12 ක නේවාසික පුහුණුවකි. පුහුණුවන්නා නේවාසික අභ්‍යන්තර පුහුණු කැඩෙට්වරයකු නම් දෙවන අදියර සඳහා සාගරය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම සඳහා වෙළෙඳ නැවකට යැවේ. බාහිරව අයදුම් කළ කැඩෙට්වරයකු නම් දෙවන අදියර සඳහා නැව තමන් විසින්ම සොයා ගත යුතුවේ.

මෙම නැව්වල සේවය කරන කාලය තුළ මෙම කැඩෙට්වරයකුට දීමනාවක් ගෙවනු ලැබේ. තුන් වන සහ අවසාන අදියර නැවත විශ්ව විද්‍යාලය තුළට ගෙන එන අතර මාස 13 ක පාඨමාලාවක් හැදෑරිය යුතුවේ. ඉන්පසු විද්‍යාලය හා වෙළෙඳ අධ්‍යක්ෂ මණ්ඩලය සමග ඒකාබද්ධව සිදු කරන පළමු සහතික පත්‍ර විභාගයට පෙනී සිටිය යුතුවේ.

මෙම විභාගයෙන් සමත් වූ විට Officer in Charge (OIC) Of An Engineering Witch නම් සහතිකය ලබා ගැනීමට හැකිවේ. එමෙන්ම ඕස්ට්‍රේලියාවේ විශාලතම රාජ්‍ය සාගර පුහුණු පහසුකම් ඇති ඕස්ට්‍රේලියා සාගර විද්‍යාලය මගින් ප්‍රදානය කරන සාගර ඉංජිනේරු ඩිප්ලෝමාව ලබා ගැනීමටත් සුදුසුකම් ලැබේ.

මෙමගින් සාගර ඉංජිනේරුවරයකු වශයෙන් ඔබගේ අනාගතය වඩාත් යහපත් අයුරින් තහවුරු කර ගත හැකිවේ. පුහුණු මාස 37 අවසානයේ නැවත Watch Keeping ඉංජිනේරුවරයකු වීමට සුදුසුකම් ලැබේ. ඉන්පසු සාගරයේදී ලැබෙන අත්දැකීම් හා විභාගවලින් පසු සාගර ප්‍රධාන ඉංජිනේරු තනතුර දක්වාම උසස්වීමට අවස්ථාව ලැබේ. සාගර ඉංජිනේරුවරයකු වශයෙන් ලෝකය නැරඹීමේ අවස්ථාව ලැබෙන අතර ම උපරිම රැකියා තෘප්තියක් ද හොඳ ආදායමක් ද මෙම පුහුණුව ලබන්නෙකුට ලබාගත හැකි වේ.

එසේම සාගර ඉංජිනේරුවන් තම ගොඩ බිමේ ද රැකියා අවස්ථා පහත ක්ෂේත්‍ර කර තිබෙනවා.

* තරු 5 හෝටල්
* ඩීසල් බලශක්ති බලාගාර
* විශාල කර්මාන්තශාලා
* නැව් අලුත්වැඩියා කරන ස්ථාන
* සාගර පාසල් හා විශ්ව විද්‍යාල
* රජයේ නැව් සමාගම්
* එක්සත් ජාතීන්ගේ
  නියෝජිත ආයතන ඉන් කීපයකි. ❑

**ඉන්දික කුඩාහෙට්ටි**

ඡායාරූප - සංජීව කැල්ලපත